# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2320/27 – 2023 පෙබරවාරි 20 වැනි සඳුදා – 2023.02.20**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය*: IR/COM/02/2016/102.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2018.11.10 දිනැති හා අංක 2096/76 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2018.10.17 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් තලංගම, කොස්වත්ත, සෙත්සිරි මාවත, අංක 259/9 (නව ලිපිනයඃ දෙහිවල, නගර සභා පටුමග, අංක 10) හි පිහිටි අන්තර් සමාගම් සේවක සංගමය (සේවකයන් 43 දෙනෙක් වෙනුවෙන්) සහ බියගම, අපනයන සැකසුම් කලාපය හි පිහිටි ඇගියෝ ටුබැකෝ ප්‍රොසෙසින්ග් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.12.05 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 ජනවාරි මස 31 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


1A – G 38911 – 11 (2022/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

කොළඹ බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.

ගොනු අංක : IR/COM/02/2016/102.
*නඩු අංකය: A/76/2018.*

අන්තර් සමාගම් සේවක සංගමය,
අංක. 10, නගර සභා පටුමග,
දෙහිවල.

පළමු පාර්ශ්වය

**එදිරිව**

ඇගියෝ ටුබැකෝ ප්‍රොසෙසින්ග් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ්,
අපනයන සැකසුම් කලාපය,
බියගම.

දෙවන පාර්ශ්වය

වර්ෂ 2022 ක් වූ දෙසැම්බර් මස 05 වන දින දීය.

**බලතල පැවරීම.**

ඉහත සඳහන් පාර්ශවයන් අතර පවත්නා ආරවුල කම්කරු හා වෘත්තීය සබඳතා හිටපු අමාත්‍ය රවින්ද්‍ර සමරවීර මහතා 1957 අංක 14, 1957 අංක 62, 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් ( විශේෂ ප්‍රතිපාදන ) පනත සමඟ කියවිය යුතු පනත් වලින් සංශෝධිත වු ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය ( 1956 ප්‍රතිශෝධිත මුද්‍රණය ) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වගන්තියෙන් ඔහු වෙත පැවරි තිබු බලතල ප්‍රකාරව බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරුවෙකු වශයෙන් මා වෙත පවරා ඇත.

**උද්ගතව පවත්නා ආරාවුලේ ස්වභාවය.**

බියගම අපනයන සැකසුම් කලාපයේ පිහිටි ඇගියෝ ටුබැකෝ ප්‍රොසෙසින්ග් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ්හි සේවය කරන වසර 12ක සේවා කාලයක් ඉක්මවූ සේවකයන් වන එනම් මෙහි අමුණා ඇති උපලේඛනගත නම් සඳහන් සේවකයන් 43 දෙනාගේ සේවා කාලය වසර 12ක් ඉක්මවූ පසු ඔවුන්ට වාර්ෂික වැටුප් වර්ධකයන් ලබා නොදීමෙන් එකී සේවකයන්ට අසාධාරණයක් සිදුව තිබෙන බවට පළමු පාර්ශවය විසින් චෝදනා කිරීමත් එය එසේ නොවන බවට දෙවන පාර්ශවය විසින් එකී චෝදනා ප්‍රතික්ෂේප කිරීමත් මත මෙම ආරාවුල උද්ගතව තිබේ.

**උපලේඛනය**

**සේවකයන් 43 දෙනාගේ නම්.**

1. වයි. එල්. කල්‍යාණිලතා.
2. ඊ. ඒ. ඩී. එල්. සඳමාලි එගොඩවත්ත.
3. ජී. කේ. සරත් කුමාර ආනන්ද.
4. පී. ඩී. අනුෂානි
5. කේ. ඩී. පුෂ්පා හේමන්ති.

23. ඒ. ආර්. ටී. එල්. රාජිනී.
24. කේ. ඒ. ඩී. ඒ. කාරියප්පෙරුම.
25. පී. ඩී. එස්. කුමාරි.
26. කේ. කුසුම් නිලන්ති.
27. වයි. ඒ. රම්‍යා නිශාන්ති.

6. ජේ. ශිරන්ති ජයවර්ධන
7. ඊ. ඒ. ඩබ්. ජී. එදිරිසිංහ.
8. එන්. එච්. නන්දසිරි.
9. එස්. එම්. එස්. පද්මිණී.
10. ආර්. එන්. ඩී. ප්‍රනාන්දු.
11. එච්. එම්. ව්. පෙරේරා.
12. එස්. පී. එන්. කුමාරි.
13. ආර්. පී. කමනි රේණුකා රාජපක්ෂ.
14. එල්. නිර්මලා පීරිස්.
15. එස්. ජී. එම්. ජී. ඩී. කරුණාරත්න.
16. කේ. පුෂ්පා දමයන්ති.
17. ඩබ්. ඒ. ඩී. පී. වාරියප්පෙරුම.
18. ඩබ්. පී. එන්. ස්වර්ණලතා.
19. කේ. පී. රංජනී කුමාරි පතිරණ.
20. ඒ. ඒ. ඩී. ගුනේන්ද්‍රිකා මල්කාන්ති.
21. ඩී. ඩී. ලීලාවතී.
22. ඩී. එස්. ප්‍රියදර්ශනී.
28. කේ. ඒ. මල්ලිකා.
29. ඊ. ඒ. ටී. ඩී. එදිරිසිංහ.
30. යූ. පී. ඒ. එම්. කරුණානායක.
31. කේ. එච්. ආර්. චන්ද්‍රලතා.
32. ඒ. එම්. මාලනී.
33. ඩබ්. ඒ. සී. රෝහිණී.
34. එච්. එච්. තුෂාරි ගීතිකා.
35. ඩබ්. ඕ. කේ. කේ. පී. විජේසිංහ.
36. ජී. ඒ. ඩී. ඩබ්. කුමාරි
37. කේ. ඒ. සී. මල්කාන්ති.
38. කේ. ඒ. ස්වර්ණලතා.
39. කේ. කේ. එස්. මානෙල්.
40. එච්. එච්. ඒ. මල්ලිකා.
41. පියසීලි ජයසූරිය.
42. එල්. ජී. පීරිස්.
43. එස්. පී. දමයන්ති.

ඉහත විස්තර සඳහන් කාර්මික ආරාවුල සම්බන්ධයෙන් වූ නඩුව විභාගයට ගැනීමට ප්‍රථමයෙන් 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනතේ අංක 39 දරන ආඥාව යටතේ 1959 මාර්තු 02 වැනි දිනැති හා අංක 11688 දරන රජයේ *ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 1969 කාර්මික ආරාවුලේ පනත සඳහන් වූ නියෝග සංග්‍රහයේ 21 (1) දරන නියෝගය පරිදි මෙකී ආරාවුලට හේතු වූ කරුණු කාරණා සම්බන්ධයෙන් පාර්ශවයන් වෙතින් විස්තර ප්‍රකාශ ඉල්ලා සිටි අතර ඊට අදාලව පළමු පාර්ශවය මෙන්ම දෙවන පාර්ශවයද ලිඛිතව කරුණු ඉදිරිපත් කර තිබේ.

**පාර්ශ්වයන්ගේ කරුණු දැක්වීම.**

එහිදී පළමු පාර්ශවය විසින් වර්ෂ 2018 ක් වූ නොවැම්බර් මස 26 දිනැතිව ඉදිරිපත් කරන ලද කරුණු දැක්වීමේදී ඉදිරිපත් වී ඇති කරුණු සාරාංශගතව පහත පරිදි දැක්විය හැකිය :

1. සේවායෝජක සමාගමේ සමස්ථ සේවක සංඛ්‍යාව 1900 ක් පමණ බව හා ඔවුන් වයස අවුරුදු 55 දක්වා සේවයේ යොදවා ගන්නා බව.

2. ඔවුන් වෙත වසර 12ක සේවා කාලයක් සම්පූර්ණ කරන තෙක් වාර්ෂික වැටුප් වර්ධක හා වාර්ෂික වැටුප් වැඩිවීම් සහ හිමිකම් දෙකම ලබා දෙන බව.

3. වසර 12 ක සේවා කාලය සම්පූර්ණ වීමත් සමග ඔවුන්ට වාර්ෂික වැටුප් වර්ධක ලබාදීම ක්‍රියාත්මක නොවන බව.

4. මෙය හේතු කරගෙන පැරණි සේවකයන්ගේ හා නවක සේවකයන්ගේ වැටුප් පරතරයේ අඩුවීමක් ඇති වෙන බව හා පැරණි සේවකයන්ගේ සේවා කාලය ඇගයීමට ලක් නොවන බව.

5. එමගින් පැරණි සේවකයන්ගේ මාසික වේතනයට අහිමිවීම් රාශියක් එකතුවන බව ඒවා අතර මූලික වැටුප, අතිකාල දීමනා, ප්‍රසාද දීමනා, සේවක අර්ථ සාධක, සේවා නියුක්ති භාර අරමුදල් මෙන්ම පාරිතෝෂිත දීමනා ද වන බව.

6. එමනිසා පැරණි සේවකයන්ට දැඩි අසාධාරණයක් සිදුවන බව හා ඔවුන්ගේ සේවා පරිනත වීම මත වැටුප් වැඩි වීම අඩුවන බව.

7. වසර අවුරුදු 12 ක් සම්පූර්ණ වූවන්ට අහිමිකර ඇති වාර්ෂික වැටුප් වර්ධක ලබා දෙන ලෙස.

8. එම වැටුප් වර්ධක අහිමිවූවන්නට හිග වැටුප් දීමනා සහ ව්‍යවස්ථාපිත දීමනා ලබා දෙන ලෙස.

**දෙවන පාර්ශවයේ කරුණු දැක්වීම.**

දෙවන පාර්ශවය විසින්ද ඉතා දීර්ඝ ලෙස කරුණු දැක්වීමක් සිදු කරන ලද අතර වර්ෂ 2018 ක් වූ දෙසැම්බර් මස 10 දිනැතිව ඉදිරිපත් කරන ලද එම කරුණු සාරාංශගතව මෙසේ ඉදිරිපත් කළ හැකිය.

1. සේවා යෝජක සමාගම සේව්‍ය සම්මේලනයේ සාමාජිකත්වය දරන බව.

2. මෙම සේවකයන් 43 දෙනා පිළිබඳව වෘත්තීය සමිති ඉතා අසාධාරණ හා නිතී විරෝධි කරුණු දැක්වීමක් සිදු කරන අතර එය ඔවුන් විසින්ම ඔප්පු කළ යුතුව තිබෙන බව.

3. මෙම නඩුවට අදාල කර ඇති සේවකයන් මෙම වෘත්තීය සමිතියේ සමාජිකත්වය දරන බවට ලේඛනගත සාධක මඟින් තහවුරු කළ යුතු බව.

4. කාර්මික ආරවුල් පනතේ විධිවිධානයන් අනුව අදාල වුවන් තම වෘත්තීය සමිතියේ සමාජිකයන් වීම මත ඔවුන් වෙනුවෙන් පෙනී සිටිය හැකි බව යන කොන්දේසිය සම්පූර්ණ කර තිබීම අවශ්‍ය බව.

5. වෘත්තීය සමිතිය ලියාපදිංචි වෘත්තීය සමිතියක් වීම අත්‍යාවශ්‍ය බව හා ඒ පිළිබඳව වෘත්තීය සමිතිය විසින් ලිඛිතවම සමාගම දැනුවත් කිරීම කළ යුතුව තිබෙන බව මෙන්ම තමන්ගේ සාමාජිකයන් කව්රුන් ද යන්නද දැනුම්දීම කළයුතු බව.

6. මෙම වැදගත් කරුණු පිළිබඳව වගඋත්තරකාර සමාගම දැනුවත් වීමක් නොමැති බැවින් මෙහි දැක්වෙන පුද්ගලයන් සමාගමේ සේවකයන්ද යන්න හඳුනා ගැනීමේ අපහසුතාවක් පවත්නා බව.

7. තවද, අංක C/O/IR/371/2017 දරන කම්කරු දෙපාර්තමේන්තු පරීක්ෂණයේදී වෘත්තීය සමිති නියෝජිතයා පරීක්ෂණ නිලධාරි ඉදිරියේදී අදාල කරුණු තහවුරු කිරීමට අසමත් වූ බව.

8. වෘත්තිය සමිතිය තම නියෝජනය සම්බන්ධයෙන් සැළකිය යුතු ආකාරයෙන් කරුණු දැක්වීමට අසමත්වීම නිසා කම්කරු දෙපාර්තමේන්තුවේදී පැමිණිල්ලට අදාලව සාකච්ඡාව තව දුරටත් පවත්වාගෙන යා නොහැකි වූ බව.

9. වග උත්තරකාර සමාගම දුම්කොල සැකසීම පිළිබඳ ව්‍යාපාරයක් පවත්වා ගෙන යන බව.

10. බේරුම්කරණ යොමුව මඟින් ඉදිරිපත් කර ඇති සේවකයන් සමාගමේ සේවකයන් වශයෙන් හා වෘත්තීය සමිතියේ සමාජිකයන් වශයෙන් හඳුනාගත නොහැකි බවත් එසේ හඳුනා ගැනීම අවශ්‍ය කරුණක්ව තිබෙන බවත්,

11. වසර 12 කට වැඩි සේවකයන්ගේ වාර්ෂික වැටුප් වැඩිවීම පිළිබඳව අදාල වෘත්තීය සමිතිය අසාධාරණ ඉල්ලීමක් මුල් කර ගනිමින් පැමිණිල්ලක් කර තිබෙන බව.

ඉහත ආකාරයෙන් තව දුරටත් දීර්ඝ වශයෙන් කරුණු දක්වමින් වගඋත්තරකාර සමාගම ඉල්ලා ඇත්තේ මෙම අයදුම්පත ප්‍රතික්ෂේප කර දමන ලෙසය.

**විසඳිය යුතු ප්‍රශ්න.**

ඉහත සඳහන් පරිදි පාර්ශවයන් විසින් ඉදිරිපත් කරන ලද කරුණු කෙරෙහිද සැළකිල්ල දක්වමින් හා මා වෙත යොමු කරන ලද ආරාවුලෙහි යොමුවේ දැක්වෙන කරුණුද අවධානයට ලක් කිරීමෙන් මෙම නඩුවට අදාලව පහත දැක්වෙන ප්‍රශ්ණ විසඳිය යුතුව තිබෙන බවට තීරණය කලෙමි.

එනම්,

i. මෙම ආරාවුලට අදාලව සේවකයන් වශයෙන් නම් කරමින් ඉදිරිපත් කර ඇති පුද්ගල නාමයන්හි දැක්වෙන අය අතර හා වගඋත්තරකාර සමාගම අතර සේව්‍ය සේවක සම්බන්ධතාවයක් පවතීද?

ii. වග උත්තරකාර සමාගම විසින් ක්‍රියාත්මක කරනු ලබන වාර්ෂික වැටුප් වර්ධක ලබාදීමේ ක්‍රමවේදයේ ස්වභාවය කුමක්ද?

iii. එම ක්‍රමවේදය කොතරම් දුරට සාධාරණ වන්නේද ?

iv. වසර 12ක සේවා කාලයක් ඉක්මවන සේවකයන්ට වාර්ෂික වැටුප් වර්ධක ලබා නොදීමෙන් ඔවුන්ට ආර්ථික වශයෙන් මෙන්ම ජ්‍යෙෂ්ඨත්වය සම්බන්ධයෙන් අගතියක් සිදුවේද?

v. එසේ අගතියක් සිදුවන්නේ නම් එය වැළකී යන ආකාරයේ කිසියම් වූ ක්‍රමවේදයන් ඉන් බැහැරව හෝ වගඋත්තරකාර සමාගම විසින් ක්‍රියාත්මක කර තිබේද?

vi. එසේත් නොවේ නම් එවැනි සේවකයන්ට යම් අසාධාරණයක් වේද? එයට ලබා දිය හැකි සහන කවරේද ? යනාදි වශයෙනි.

මෙම ප්‍රශ්නයන්ට විසඳුම් සෙවීම් වස් පාර්ශවයන්ගේ සහභාගීත්වය ඇතිව මෙම නඩුව විභාගයට ගැනීමට තීරණය කරන ලද අතර වර්ෂ 2019 ක් වූ අප්‍රේල් මස 30 වන දින ප්‍රථම වරට නඩු විභාගය ආරම්භ කරන ලදී. ඉන් ඉක්බිතිව පාර්ශවයන්ගේ එකඟතාවය ඇතිවම වර්ෂ 2022 ක්වූ අගෝස්තු මස 16 වැනි දින දක්වාම නඩුව අවස්ථාවෙන් අවස්ථාවට විභාගයට ගන්නා ලද අතර එදින පැමිණිලිකාර පාර්ශවය *හෙවත්* පළමු පාර්ශවය කිසිදු දැනුම් දීමකින් හෝ තොරව නඩු විභාගය සඳහා ඉදිරිපත් වූයේ නැත. නඩු විභාග දිනයන්හී නොදන්වා නොපැමිණීම පළමු පාර්ශවය තුළින් දිගින් දිගටම දැකිය හැකි වූ දුර්වලතාවයක් විය. මේ සම්බන්ධයෙන් විවිධ අවස්ථාවන්හිදී පැමිණිලි පාර්ශවයට අවවාද කිරීම් කිරීමට ද සිදුවිය. එහෙත් එකී පාර්ශවය වෙතින් එහි ප්‍රගතියක් දැකිය නොහැකි වූ බවද මෙහිලා සඳහන් කළ යුතුව තිබේ.

ඒ කෙසේ වුවද නැවත මෙම නඩුව වර්ෂ 2022 ක්වූ සැප්තැම්බර් මස 14 වන දින පෙරවරු 10.30 ට විභාගයට ගැනීම සඳහා තීරණය කළද මෙම නඩුවේ පළමු පාර්ශවය වශයෙන් අන්තර් සමාගම් සේවක සංගමය වර්ෂ 2022 ක්වූ සැප්තැම්බර් මස 14 වැනි දිනද ලිපියක් මගින් බේරුම්කරණය වෙත දන්වා සිටියේ මෙම ආරවුලට අදාල සේවක සේවිකාවන් මේ අවස්ථාව වන විට ආයතනයේ සේවයෙන් ඉවත් කර තිබීම හා මෙම නඩුව සම්බන්ධයෙන් ඔවුන්ගේ උනන්දුවක් නොමැතිවීම හේතු කරගෙන තම සංගමයට මෙම නඩුව තවදුරටත් පවත්වාගෙන යාම අපහසු වී තිබෙන බැවින් ඉල්ලුම්පත්‍රය ඉල්ලා අස්කර ගන්නා බවයි. ඉල්ලුම්කාර සංගමයේ ප්‍රධාන ලේකම්ගේ අත්සනින් යුතුව ඉදිරිපත් කරන ලද එම ලිපිය පදනම් කරගෙන මෙම ඉල්ලුම්පත්‍රය සම්බන්ධයෙන් කිසිදු ප්‍රදානයක් ලබා නොදීමට තීරණය කළෙමි.

එල්. ආර්. සුමතිපාල,
බේරුම්කරු.

EOG02 - 0230